# දේශීය ආහාර නිෂ්පාදන වැඩසටහනෙහි දී රාජ්‍යමය මැදිහත් වීමෙහි ඇති වැදගත්කම

වසර දෙදහස් පන්සීයයකටත් වඩා අධික වූ ඉපැරණි ඉතිහාසයක් ඇති ශ්‍රී ලංකාව අතීතයේ සිට ම ප්‍රචලිත වී ඇත්තේ කෘෂිකාර්මික රටක් වශයෙනි. ක්‍රි.පූ. 6 වැනි සියවසේ දී විජය සමග මෙරටට පැමිණි ඔහුගේ අනුගාමිකයින් හා අනෙකුත් පිරිස් පදිංචිය සඳහා තෝරා ගත්තේ ද කෘෂිකර්මාන්තය සඳහා යෝග්‍ය ගංගා ධාරයන් ය. වරින් වර බලයට පැමිණි ධාතුසේන, මහසෙන්, මහා පරාක්‍රමබාහු ඇතුළු බොහෝ රජවරුන්ගේ ද මූලික අවධානය යොමු වූයේ මහා සමුද්‍රය පරයන "කලාවැව", "මින්නේරිය", "මහා පරාක්‍රම සමුද්‍රය" වැනි ජලාශ ඉදිකොට වාරි කර්මාන්තය දියුණු කරමින් ආර්ථිකයෙහි මූලික පදනම වූ කෘෂිකර්මාන්තය දියුණු කිරීමටය. මෙවැනි අතීත වීරවරුන්ගේ උත්සාහයෙහි ඵලය වූයේ ගම පමණක් නොව රටත් සහල් හා අනෙකුත් ආහාරවලින් සරුවීම පමණක් නොව ශ්‍රී ලංකාව "පෙරදිග ධාන්‍යාගාරය" ලෙස ප්‍රචලිත වීමය. ඉතිහාසයේ එකිනෙක අවධිවල අනුරාධපුරය, පොළොන්නරුව, දඹදෙණිය, යාපහුව වැනි ශ්‍රේෂ්ඨ රාජධානි බිහිවීමත්, ඒ යටතේ මනරම් ගෘහ නිර්මාණ හා කලා ශිල්ප බිහිවීමත්, මෙම කෘෂි සංවර්ධනයේ උත්කෘෂ්ඨ ප්‍රතිඵල විය.

### සමාජ - සංස්කෘතික සැකැස්ම

ආර්ථිකයේ පදනමසේ ම මෙරට සමාජ හා සංස්කෘතික සැකැස්මෙහි පදනම වූයේ ද කෘෂිකර්මයයි. වැවයි- දාගැබයි, ගමයි - පන්සලයි යන්න ශ්‍රී ලාංකික සංස්කෘතියේ සංකේත විය. කෘෂිකර්මය ජීවනාලිය වූ ශ්‍රී ලාංකිකයාගේ දිවි පෙවෙත බෞද්ධ දර්ශනය මගින් මනාව සකස් කෙරිණ. සමාජ වටිනාකම් හා හර පද්ධතීන් බෞද්ධ ප්‍රතිපදා අනුව සැකසිණ. ගොවිතැන ධාර්මික කටයුත්තක් වූවා පමණක් නොව, අනුන්ට අත නොපා ජීවත් විය හැකි හා මහත් ගෞරවයෙන් සඳහන් කළ හැකි වෘත්තියක් ද විය. "මඩ සෝදා ගත් ගොවියා රජකමට වුව ද සුදුසුය" යන කියමන ඇති වූයේ එහෙයිනි. කෘෂි සමාජයේ ශ්‍රම හා සම්පත් භාවිතය ද මෙවන් හර පද්ධතීන් ඔස්සේ සිදු වූ අතර එය සමාජ ප්‍රගමනය සඳහාම විය. උදාහරණ ලෙස, පරෝපකාරය, මිත්‍රත්වය, අන්‍යෝන්‍ය සුහද බව හා සාමූහිකත්වය පිළිබිඹු කරන "කයිය", "ශ්‍රම දානය" හා "අත්තම" වැනි ශ්‍රම භාවිත ක්‍රමත් අනුන්ගේ දිවි පෙවෙත තහවුරු කිරීම හා සමානාත්මතාවය සඳහා උරදෙන "තට්ටුමාරු", "කට්ටිමාරු" වැනි ඉඩම් බුක්ති ක්‍රමත් "බෙත්ම ක්‍රමය" වැනි ඉඩම් භාවිතයනුත් පැවැත්මට ඒමෙන් එය තහවුරු වේ.

### කෘෂිකාර්මික හා සමාජ පරිහානිය

දහසය වන ශත වර්ෂයේ සිට මෙරට විවිධාකාරයෙන් පාලනය කළ විදේශ ජාතිකයින්ගේ ක්‍රියා කලාපය හේතුවෙන් මෙරට ආර්ථිකයේ පදනම වූ කෘෂිකර්මය බිඳ වැටීම ආරම්භ විය. නිදහස ලැබුණු අවධියේ සිට ම ගොවිජනපද ආරම්භ කිරීම් හා නවීන තාක්ෂණ ක්‍රම හඳුන්වා දීම් ආදී ක්‍රම මගින් කෘෂිකර්මය යම් තරමකට නගා සිටුවීමට උත්සාහ ගනු ලැබුවත් 1977 න් පසු මෙරට සියලු රජයන් විසින් අනුගමනය කළ නිදහස් ආර්ථික ප්‍රතිපත්තීන් හා කෘෂිකර්මය කෙරෙහි ප්‍රමාණවත් පරිදි රජයේ සැලකිල්ල යොමු නොකිරීම එහි පරිහානිය පිණිසම හේතු විය. විශේෂයෙන් ම, නිදහස් ආර්ථික ප්‍රතිපත්තීන් යටතේ පාලනයකින් තොරව ආහාර ද්‍රව්‍ය ඇතුළු සෑම දෙයක්ම විදේශ රටවලින් ගෙන ඒමට දොර විවෘත කිරීම නිසා මෙරට පහසුවෙන් වැවිය හැකි බොහෝ ආහාර ද්‍රව්‍ය විදේශවලින් ගෙන ඒමේ පුරුද්ද ඇති විය. මේ සමග ම දේශීය ගොවියාට ඇති වූ වෙළඳපළ ප්‍රශ්නය පමණක් නොව ශ්‍රමය සඳහා වන අධික වියදම, තාක්ෂණික උපදෙස් පහසුවෙන් ලබාගත නොහැකි වීම, වඩාත් හොඳ බීජ හා රෝපණ ද්‍රව්‍ය හිඟය, යෙදවුම් මිල ඉහළ යාම, යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම යනාදී වූ ප්‍රශ්න විසඳීම සඳහා රජය ප්‍රමාණවත් පරිදි මැදිහත් නොවීම හේතුවෙන් දේශීය කෘෂිකර්මය මුළුමනින් ම බිඳ වැටිණි.

ඉහත දැක් වූ හේතු නිසා කෘෂිකර්මය අලාභදායී කටයුත්තක් බවට පත්විය. "ගොවිතැන" තව දුරටත් ගෞරවාන්විත රක්ෂාවක් වනු වෙනුවට ගොවියකු යැයි පැවසීමත් මදිකමට හේතුවක් වන්නට විය. දේශීය ගොවියා කෘෂිකර්මයෙන් ඉවත් වූවා පමණක් නොව, තම දරුවන් ද කෘෂිකර්මයෙන් බැහැර රැකියාවන් කෙරෙහි යොමු කර වීමට පෙළඹින. වගාවන්, ක්‍රමයෙන් පුරන් වන්නට විය. අනාදිමත් කාලයක සිට දේශය තුළ වගා කළ පෝෂ්‍යදායී ආහාර වන අල, බතල, මුං, කුරහන් යනාදිය වගාවෙන් ඉවත් විය. ඒ වෙනුවට තිරිඟු පිටි යනා දී ආදේශන වැඩි වැඩියෙන් පිටරටින් ගෙන්වීමට පෙළඹිණි. තිරිඟු පිටි පදනම් කරගත් ආහාර බෙහෙවින් ආහාරයට ගැනීමත් ආහාර පරිභෝජන ශෛලියෙහි ඇති වූ වෙනස්කමුත් නිසා අයහපත් ප්‍රතිඵල ඇති වන්නට විය. මින් මූලික වන්නේ පෝෂ්‍යදායී ආහාර සිරුරට නොලැබීම නිසා රටෙහි ජනගහනයෙන් විශාල ප්‍රමාණයක් රෝගාබාධවලින් පෙළීමට පටන් ගැනීමයි. දියවැඩියාව, අධික රුධිර පීඩනය හා හෘදයාබාධ වර්තමානයේ බොහොමයක් වැඩිහිටියන් අතර පවත්නා සාමාන්‍ය රෝගාබාධ බවට පත් ව ඇත. රටෙහි අනාගතය බාර ගැනීමට සිටින වයස 5 ට අඩු දරුවන්ගෙනුත් 30%ක් පමණ මන්ද පෝෂණයෙන් පෙළෙන බව හෙළි වී ඇත. මේ තත්ත්වය ආහාර ආනයනය සඳහා විශාල විදේශ විනිමය ප්‍රමාණයක් වැය කිරීමට සිදු වීමෙන් පමණක් නොව රෝගාබාධ හේතුවෙන් ආරෝග්‍යශාලා කරා පැමිණෙන්නන් වෙනුවෙන් වියදම් කිරීමට සිදු වීමෙන් රජයට ද මහත් බරක් වී ඇත.

කෘෂිකාර්මික පරිහානියත් සමග ඇති වූ ආර්ථික ප්‍රශ්න හේතුවෙන් "කයිය"/"අත්තම" යනා දී වූ කෘෂි සමාජයේ අන්‍යෝන්‍ය මිත්‍රත්වයට හා සුහදත්වයට තුඩුදුන් ශ්‍රම භාවිත ක්‍රමයන් ද ක්‍රමයෙන් වියැකී යන්නට විය. මේ හේතුවෙන් ගොවි සමාජය ද පෞද්ගලිකත්වය පෙරදැරි කරගෙන කටයුතු කරන එකක් බවට පත් වූවා පමණක් නොව, ගොවියා වඩ වඩාත් හුදකලා විය.

### රාජ්‍ය මැදිහත් වීම

වගා කළ හැකි විශාල ඉඩම් ප්‍රමාණයක් තිබිය දී ඒවා ඵලදායී ලෙස වගාවට යොදා නොගැනීම හේතුවෙන් මතු වී ඇති මහත් ව්‍යසනයන් හමුවේ යථා තත්ත්වය අවබෝධ කොටගෙන නැවතත් කෘෂිකර්මාන්තය තුළට සෘජු ලෙස මැදිහත්වීමට රජය ගෙන ඇති තීරණය ඉතා පැසසිය යුත්තකි. "අපි වවමු-රට නගමු" යන තේමාව යටතේ දේශීය ආහාර නිෂ්පාදනය වැඩි කිරීමේ ජාතික මෙහෙයුමක් ලෙස අරඹා ඇති එම මැදිහත්වීමෙහි මූලික අපේක්ෂාව වී ඇත්තේ නැවතත් දේශීයව වැවිය හැකි ආහාරවලින් රට ස්වයං පෝෂිත කර, ඒ ඔස්සේ රැකියා, ආදායම් හා පෝෂණ මට්ටම ඉහළ දැමීම බව පෙනේ. කෙසේ වුව ද, මෙරට කෘෂිකර්මය දියුණු කිරීම සඳහා ඉතිහාසය තුළ දී රාජ්‍ය මැදිහත් වීම සිදු වූ පරිද්දෙන් නැවතත් රජය ක්‍රියාකාරී ලෙස මැදිහත් වීම කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ පුනර්ජීවනය සඳහා කිහිප ආකාරයකින්ම වැදගත් වේ. මෙහි දී අදාළ වැඩසටහන සැලසුම් කිරීම, ප්‍රගති සමාලෝචනයට භාජනය කිරීම හා ඇගයීම යනාදී වූ ආකාරයන්ට අමතර වූ බීජ හා රෝපන ද්‍රව්‍ය ලබා දීමට කටයුතු කිරීමෙනුත් අවශ්‍ය යටිතල පහසුකම් ලබා දීමෙනුත් රජය මැදිහත් වීමට අපේක්ෂා කෙරේ.

ඉහත දැක් වූ ආකල්ප වෙනස් කිරීම සියලු ආකාරයන්ටත් වඩා රජයේ මැදිහත්වීම තුළ සමාජීය වැදගත් භාවයක් ඇත. නිදහස් ආර්ථික හා ගෝලීයකරණ බලපෑම් හමුවේ ගොවිතැන කෙරෙහි මෙරට සමාජය තුළ ඇත්තේ පහත් ආකල්පයකි. ග්‍රාමීය සමාජය තුළ වුව ද, ඒ කෙරෙහි ගොඩනැගෙමින් ඇත්තේ කළකිරීමක් හා අකමැත්තකි. මේ ස්වභාවය වෙනස් කර ගොවිතැන අභිමානවත් හා සමාජය තුළ අගය කළ යුතු කටයුත්තක් බව සමාජයේ සියලුදෙනා තුළ තහවුරු කිරීම සඳහා රජයේ මැදිහත් වීම ඉතා වැදගත්ය. ආකල්ප වෙනස් කිරීමේ කාර්යයේ දී රජයකට කළ හැකි කාර්යභාරය අන් කවරෙකුටත් වඩා ඉහළය. මේ කාරණයේ දී මෙරට ආහාර අතර වඩාත් පෝෂ්‍යදායී ආහාරයක් ලෙස ග්‍රාමීය ජනතාව අතර ප්‍රචලිතව පැවති එහෙත් නූතන සමාජ ඇගයුම් හා වටිනාකම් හමුවේ නොසැලකිල්ලට භාජනය වෙමින් පැවති "කොළ කැඳ" නැවතත් ප්‍රචලිත කිරීම සඳහා වර්තමාන ගරු කතානායක, දේශීය වෛද්‍ය අමාත්‍යව සිටිය දී අනුගමනය කරනු ලැබූ ක්‍රියා කලාපයෙන් ලද ප්‍රතිඵල උදාහරණයකට ගෙනහැර දැක්විය හැක.

වර්තමානයේ කොළ කැඳ සඳහා ඇති මහත් ඉල්ලුම නිසාම ඈත පිටිසර ප්‍රදේශවල පමණක් නොව කොළඹ වැනි නාගරිකයන්හි පවා පාර දෙපස කොළ කැඳ විකුණමින් ජීවිකාව කර ගෙන යන විශාල පිරිසක් සිටිති. කොළ කැඳ බීම සඳහා ද කාර්යාලීය ඉහළ නිලධාරීන්ගේ සිට සමාජයේ පහළම මට්ටමේ සිටින දුගී දුප්පත් අසරණයන් දක්වා වූ පිරිස් කිසිදු තරාතිරමකින් තොරව ඉදිරිපත් වෙති. රාජ්‍ය මැදිහත්වීමකින් වූ ආකල්පමය වෙනස මින් කියා පායි.

### දේශපාලනික සහාය

"අපි වවමු – රට නගමු" වැඩසටහන ද එදා හෙළ දවස සිහි කරමින් රාජ්‍ය පාලකයා වප්මඟුල් උත්සවයට සහභාගී වී නැකතට සී සෑ ආකාරයට ගරු ගාම්භීර අයුරින් වගා කටයුතු පටන් ගැනීමට සැලසුම් කර තිබීම ගොවිකමට මහත් අභිමානයක් ගෙන දෙන්නකි. එපමණක් නොව එය අනුගමනය කරමින් ඒ ඒ දිස්ත්‍රික්ක මට්ටමින් ද වගා සංග්‍රාමයට මුල පිරීම සඳහා ඒ ඒ දිස්ත්‍රික්කවල දේශපාලන අධිකාරීන් වෙන වෙන ම වප්මඟුල් පවත්වා සී සෑමට සහභාගී වීම කෘෂිකර්මය සඳහා දිරි ගන්වන සුළුය. තවදුරටත් දේශපාලනඥයන් පවා වගා කටයුතු වලට නැඹුරු කරවා ගැනීම පිණිස ඔවුන්ගේ ගෙවතු සංවර්ධනය කිරීම සඳහා ඔවුන්ව පෙළඹ වීමට සැලසුම් කර ඇත.

### අනෙකුත් අයගේ සහාය

මෙම වැඩසටහන මගින් සැලසුම් කර ඇති පරිදි පාසැල්, කාර්යාල යනාදියේ පමණක් නොව පාසැල් ළමුන් හා කාර්යාලවල නිලධාරීන් හා අනෙකුත් සේවකයන් යන අයගේ ගෙවල්වල ද ආදර්ශ වගා මෙන් ම ගෙවතු පවත්වාගෙන යාම සඳහා උනන්දු කර වීම මෙරට සියලු තරාතිරමේ පුද්ගලයින් කෘෂිකර්මය සඳහා සහභාගී කර ගැනීමට තැත් කිරීමකි. එය කෘෂිකර්මය සම්බන්ධයෙන් යහපත් ආකල්ප ගොඩනැගීම සඳහා බෙහෙවින් ම ඉවහල් වනු නොඅනුමානය. විශේෂයෙන් ම පාසැල් ළමුන් ඒ සඳහා යොමු කර වීම මහත් ප්‍රතිඵල ගෙන දීමට සමත් වේ. වර්තමාන පාසැල් ශිෂ්‍යයින් අනාගතයේ දී වැඩිහිටි පුරවැසියන් වනු ඇත. ඒ නිසා ඔවුන් සියලුදෙනා තුළ ආකල්පමය වෙනසක් ඇති කර කෘෂිකර්මය සඳහා ඔවුන් නැඹුරු කර වීම අනාගත කෘෂිකර්මයේ ම යහපත පිණිස හේතු වේ. වර්තමාන අධ්‍යාපන ක්‍රමය තුළ සියලු දෙනාට ම කෘෂිකර්මය පිළිබඳ දැනුමක් හෝ අත්දැකීමක් ලබා ගැනීමට අවස්ථාවක් නොමැත. එහෙත් මීට වසර ගණනාවකට ඉහත දී පාසැලෙහි "වතුවැඩ" සඳහා සිසුන්ට දිනපතා වෙන් කර තිබූ කාල පරිච්ඡේදය තුළ දී පාසැල් භූමිය තුළ විවිධ වගා කටයුතුවල නියැළීමෙන් ඒ පිළිබඳව මහත් අත්දැකීමක් ලැබීමට සිසුහු සමත් වූහ. එහෙත් ඒ අවස්ථාවන් වර්තමාන සිසුන්ට නොලැබීම ගොවිතැන කෙරෙහි කුතුහලයෙන් බැලීමට මෙන් ම ඒ පිළිබඳව ඔවුන් තුළ වැරදි ආකල්ප ජනිත කරවීමට ද උපකාරී වී ඇත. එවැනි පසුබිමක් තුළ සියලු පාසල්වල වගා ආදර්ශන ඇති කිරීම සඳහාත් ඉන් ලබන දැනුම පදනම් කර ගනිමින් සියලු සිසුන්ට ගෙවතු පවත්වාගෙන යාම සඳහාත් උනන්දු කරවීම තුළින් ඔවුන් කෘෂිකර්මය දෙස සුබවාදීව බැලීමට හුරු කරවන නිසා එය අනාගත කෘෂිකර්මය සඳහා ශක්තිමත් අත්තිවාරමක් වනු ඇත.

### ඉල්ලුම වැඩි කිරීම

බොහොමයක් දේශීය කෘෂි නිෂ්පාදන සඳහා උසස් ඉල්ලුමක් නොමැති වීම කාලයක් තිස්සේ දේශීය ගොවියා මුහුණපානු ලැබූ ප්‍රබල ගැටළුවකි. නව වගා වැඩසටහන යටතේ වී අලෙවි මණ්ඩලය නැවත ස්ථාපිත කිරීම මගින් දේශීය නිෂ්පාදන ද්‍රව්‍ය මිල දී ගැනීමට කටයුතු සැලසේ. එහෙත් මෙම ගැටළුව සඳහා ස්ථිර සාර වූ විසඳුමක් ලබා ගැනීමට නම් දේශීය ආහාර පරිභෝජනය සඳහා රටෙහි ජනතාව උනන්දු කර වීම අත්‍යවශ්‍ය වේ. මේ කටයුත්තතේ දී ද, රාජ්‍ය මැදිහත් වීම මගින් කළ හැකි කාර්යභාරය අතිවිශාලය. දේශීය ආහාර භෝග සඳහා ඉල්ලුම වැඩි කිරීම සම්බන්ධයෙන් රජයට මැදිහත් විය හැකි ක්‍රම කිහිපයකි. එකක් නම් මුං, කව්පි, කුරක්කන් වැනි දේශීය ආහාරවල ඇති පෝෂ්‍යමය වැදගත්කම පිළිබඳ ජනතාවගේ දැනුවත්භාවය වර්ධනය කර ඒවා පාරිභෝජනය සඳහා ඔවුන් උනන්දු කරවීමයි. තවත් ක්‍රමයක්

වන්නේ රාජ්‍ය උත්සව, සම්මන්ත්‍රණ, වැඩමුළු හා පුහුණු පාඨමාලා යනා දී අවස්ථා වල දී හැකි තරම් දේශීය ධාන්‍ය හා අනෙකුත් ආහාර වලින් සකස් කරන ලද කෑම බීම පරිභෝජනය සඳහා උනන්දු කරවීමයි. දැනටත් කුරක්කන් "හැලප" "රතු සහල් බත්" යනාදීය සඳහා ඇතැම් පිරිස් අතරින් ඉල්ලුමක් තිබේ. එය තව තවත් වර්ධනය කළ යුතුය.

## සංචාරක කර්මාන්තය

සංචාරක කර්මාන්තය ආශ්‍රිතව ද දේශීය ආහාර ප්‍රචලිත කිරීමට අවස්ථාව තිබේ. මෙරට බොහොමයක් සංචාරක මධ්‍යස්ථාන හා අවන්හල්වල දේශීය ආහාර භාවිතය අඩුය. එහෙත් බොහොමයක් ආසියානු රටවල අවන්හල් හා සංචාරක මධ්‍යස්ථානවල දේශීය ආහාර ප්‍රචලිතව භාවිතා වේ. විදේශිකයින් එවැනි දේශීය ආහාර රස බැලීමට කැමතිය. ඒ සඳහා අවශ්‍ය කටයුතු පිළියෙල කිරීම මගින් ඔවුන් අතර දේශීය ආහාර ජනප්‍රිය කළ හැක.

දේශීය ආහාර වර්ග භාවිතා කිරීම මගින් සකස් කළ හැකි රසවත් නිෂ්පාදන ඇති කිරීම හා ජනප්‍රිය කිරීම සඳහා ද රජයේ අවධානය යොමු විය යුතුය. ඉන්දියාව, තායිලන්තය වැනි රටවල විනෝදමත් අවස්ථාවල දී ආහාරයට ගත හැකි දේශීය ධාන්‍ය වලින් සැකසූ ආහාර වර්ග බොහොමයක් තිබේ. මෙරටේ ද එවැනි ආහාර වර්ග සම්බන්ධව අත්හදා බැලීම් සිදු කර ඒවා ප්‍රචලිත කළ හැකිය. ඒ මගින් දේශීය ආහාර සඳහා ඇති ඉල්ලුම වැඩි කළ හැකිය. එවිට ඒවා වගා කරන්නෝ ද ඒ සඳහා උනන්දු වෙති.

## අඛණ්ඩව රාජ්‍ය මැදිහත්වීම

දැනටමත් සැලසුම් කර ඇති ආකාරයන්ගෙන් මෙන් ම මෙහි සඳහන් කළ ආකාරයෙන් කෘෂිකර්මය සඳහා රජයේ මැදිහත් වීම වඩාත් පුළුල් කිරීම හා අඛණ්ඩව පවත්වා ගැනීම මගින් කෘෂිකාර්මික සංවර්ධනය සඳහා රට තුළ වඩාත් සුබවාදී පරිසරයක් ඇති වනු නියතය. එසේ රාජ්‍ය මැදිහත් වීමකින් තොර කෘෂිකාර්මික දියුණුවක් කිසිදු රටකින් අපේක්ෂා කළ නොහැක. ආර්ථිකයේ ඉහළම අඩියට නැග ඇති අමෙරිකා එක්සත් ජනපදය වැනි රටවලත් කෘෂි ද්‍රව්‍ය මිල මට්ටම පහළ යාම් වැනි අවස්ථාවන්හි දී ගොවීන්ට වන පාඩුව අවම කිරීම සඳහා රාජ්‍ය මැදිහත් වීමක් සිදු වේ. කෘෂිකර්මය වැනි ස්වභාව ධර්මය සමග කරන කටයුත්තක දී රාජ්‍ය මැදිහත් වීම මුළුමනින්ම ඉවත් කරගැනීමක් ගැන සිතිය නොහැක. ඒ අනුව, රටෙහි ජනතාවගෙන් සැලකිය යුතු පිරිසකගේ ජීවනාලිය කෘෂිකර්මය වන සංවර්ධනය වෙමින් පවත්නා රටක් වන ශ්‍රී ලංකාවේ, කෘෂිකාර්මික සංවර්ධනය සඳහා රාජ්‍ය මැදිහත් වීම වඩාත් සක්‍රීයව පැවතීම යහපත් අනාගතයක් දකින සැමගේ ප්‍රාර්ථනය විය යුතුය.

**ජේ.කේ.එම්.ඩී. චන්ද්‍රසිරි.**
*අංශ ප්‍රධාන*
**කෘෂි ප්‍රතිපත්ති හා ව්‍යාපෘති ඇගයීම් අංශය**
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය.

## ජන කවියක්

නිති බත් දීමය මට බැරි වෙන්නේ
අදවත් රස කර උයලා දෙන්නේ
කිරි බත් සමගින් කැවිලි සදන්නේ
කවදත් මෙලෙසට අපි දන් දෙන්නේ

*- පොත පත ඇසුරෙනි -*